**සූරියවැව ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 17 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට සූරියවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2017 වර්ෂයේ ජ'නල් සටහන් අංක 06 මඟින් සමුච්චිත අරමුදලට ගලපා තිබූ රු. 589,343 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය ගැලපීම් කර ගිණුම් නිවැරදි කළ යුතුවේ. | ඉදිරියේදී හඳනා ගැනීමට උත්සාහ ගන්නා බව දන්වමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී සභාව සතු දේපල සංවර්ධනය සඳහා වැය කරන ලද රු. 82,260 ක් ගිණුම්ගත කර නොතිබුණි. | දේපළ සංවර්ධන වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු. 403,818,931 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාලව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉඩම් 17 න් 07 ක අයිතිය ප්‍රාදේශීය ලේකම් හා මහවැලි අධිකාරිය සතු වන බවත්, උපලේඛනය පිළිතුරු සමඟ ඉදිරිපත් කරන බව සහ අනුමැතිය ලද ලිපි කර්මාන්ත ලේඛනයේ සටහන් කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම

## 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 | අයවැය සමඟ අය හා වැය විෂයයන් සඳහා අතිරික්තතා හා ඌණතාවලට හේතු දැක්වෙන ප්‍රකාශයක් පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේදී ගිණුම සමඟ ඉදිරිපත් කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 (3) | කල් ඉකුත් වූ රු. 52,065 ක තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සභා ආදායමට ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/ පපාකො /2010/01 දරණ චක්‍රලේඛයේ 04 ඡේදය | සභාව සතු කඩ කාමර 11 කින් එක්වන් මුදල් රු. 412,592 ක් අය කරගෙන නොතිබුණු අතර 2011 වර්ෂයට පෙර හිඟ ශේෂය රු. 292,592 ක් විය. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | හිඟයෙන් රු. 270,992 ක් අයකර ගත නොහැකි වීම මත කපා හැරීම සඳහා පළාත් පාලන කොමසාරිස් දැනුවත් කළ බවත්, ඉතිරිය අය කර ගැනීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අවසානයට සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු 6,767,505.ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,762,304 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| --- | --- | --- | --- | --- | --- | --- | --- | --- |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 1,053,000 | 1,014,470 | 992,150 | 22,320 | 831,000 | 911,710 | 914,460 | 15,350 |
| කුලී | 21,931,200 | 20,624,811 | 20,144,852 | 1,688,640 | 19,323,100 | 17,077,595 | 17,008,480 | 981,065 |
| බලපත්‍ර ගාස්තු | 1,251,100 | 1,589,404 | 1,485,104 | 16,500 | 1,229,100 | 1,283,599 | 1,309,049 | 1,750 |
| වෙනත් ආදායම් | 7,957,000 | 5,896,693 | 2,850,847 | 4,284,578 | 2,037,000 | 6,727,844 | 4,531,201 | 7,873,297 |
| එකතුව | 31,139,300 | 29,125,378 | 25,472,953 | 6,012,038 | 23,420,200 | 26,000,748 | 23,763,190 | 8,871,462 |

### 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2006 වර්ෂයේදී සංස්ථාපනය කළ සූරියවැව ප්‍රාදේශීය සභාව 2017 වර්ෂයේදී වසම් 02 ක් දියුණු කළ ප්‍රදේශ ලෙස හඳුනාගත්තද ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | දියුණු කළ ප්‍රදේශ වල වරිපනම් බදු තක්සේරු කර අයකරගත යුතුවේ. | තක්සේරු දෙපාර්තමේන්තුව තක්සේරු කටයුතු මේ දක්වා සිදු නොකිරීම නිසා වරිපනම් අය කළ නොහැකි වූ බව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු ව්‍යාපාර බදු රු. 22,320 ක් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනත159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟයෙන් 2020 වර්ෂයේ මාර්තු මස රු. 360 ක් අයකරගත් බවත්, ඉතිරි මුදල සඳහා නඩු පැවරූ බව දන්වමි. |

### 2.2.3 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට කඩ කාමර 34 කින් ලැබිය යුතු කඩ කාමර කුලී රු.911,825 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙහි හිඟ හිටි කාල පරාසය මාසයත් මාස 86 ත් අතර විය. | හිඟ කඩ කුලී ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟයෙන් රු. 45,000 ක් අයකර ගත් බවත්,රු. 552,910 ක් සඳහා නඩු පවරා ඇති බවත් රු. 228,550 ක් කපා හැරීමට පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කළ බව සහ ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට සූරියවැව සති පොළ හා තොග පොළට අදාළව ලැබිය යුතු රු. 417,849 ක් හා සූරියවැව සති පොළ රථගාලට අදාළ ඉකුත් වර්ෂය සඳහා ලැබිය යුතු රු. 23,415 ක බදු වාරික අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟයෙන් රු. 417,849 ක් කපා හැරීමට පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කළ බව සහ ඉතිරි රු. 23,415 ක් අයකර ගැනීමට සමත මණ්ඩලයට යොමු කලෙමි. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු දැනිවීම් පුවරු ගාස්තු රු.87,800 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ දැන්වීම් පුවරු ගාස්තු අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. | හිඟයෙන් රු. 20,800 ක් අයකර ගත් බවත්, ඉතිරි රු. 67,000 ක් අයකර ගැනීමට නඩු පැවරූ බව දන්වමි. |

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙළින් රු.3,799,091 ක් හා රු.90,496 ක් විය. ලැබිය යුතු උසාවි දඩ ශේෂය රු.745,829 ක් ඉකුත් වර්ෂයට අදාළ විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ලැබිය යුතු උසාවි දඩ මුදලින් රු. 1,120,000 ක් අයකර ගත් බවත්, හිඟ මුද්දර ගාස්තු සම්පූර්ණයෙන්ම අයකර ගත් බව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක්ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කාරණා 28 ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන අමාත්‍යවරයා සාදනු ලැබ 1988 අගෝස්තු 23 දින ගැසට් කළ සම්මත අතුරු ව්‍යවස්ථා කරුණු 29 ක් 2012 වර්ෂයේදී වැලඳගත් බවත්, දකුණු පළාත් සභා විෂයය භාර අමාත්‍යවරයා සාදන ලද අතුරු ව්‍යවස්ථා කරුණු 29 න් 27 ක් 2017 වර්ෂයේදී වැලඳගත් බව සහ මේ වන විට කරුණු 56 ක් වැලඳගෙන ඇති බව දන්වමි. |

(ආ) **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් දෛනිකව රැස් කරනු ලබන කසළ වෙන් කිරීමකින් තොරව සභාවට පවරා ගත් ඉඩමකට අවිධිමත් ලෙස බැහැර කරමින් තිබූ අතර මීට වසර කිහිපයකට පෙර ආරම්භ කිරීමට සැලසුම් සකස් කර තිබූ කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමේ වැඩසටහන ආරම්භ කර නොතිබුණි. මධ්‍යම පරිසර අධිකාරිය මඟින් පාරිසරික නිර්දේශ ඇතුළත් කොන්දේසි 06 ක් ලබා දී තිබුණද එය ද ක්‍රියාත්මක කර නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය නිවැරදිව කළමනාකරණය කළ යුතුවේ. පාරිසරික නිර්දේශ වල ඇතුළත් කොන්දේසි ක්‍රියාත්මක කළ යුතුවේ. | මධ්‍යම පරිසර අධිකාරිය පිළිසරු ව්‍යාපෘතිය යටතේ ප්‍රතිපාදන ලබා දෙන බවට 2014 වර්ෂයේ සිට දැනුවත් කළද මෙතෙක් නොලැබීමත්, මහවැලි අධිකාරියෙන් ලබා දුන් ඉඩමට අනවසරකරුවන් ඇතුල්වීම මත විදුලි වැටද ඉදිකළ නොහැකි වූ බවත් ව්‍යාපෘතිය ඉදිරියේදී සභා අරමුදල් හා බාහිර ආධාරද මත ක්‍රියාත්මක කරන බව දන්වමි. |

(ඇ) **සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී අයවැය මගින් ප්‍රතිපාදන සලසා තිබූ රු.4,444,263 ක කර්මාන්ත ඉදිකිරීම් ව්‍යාපෘති 45 ක් ක්‍රියාත්මක කර නොතිබූ අතර අයවැය මගින් ප්‍රතිපාදන සලසා නොතිබූ රු.1,484,300 ක් වූ ව්‍යාපෘති 16 ක් ක්‍රියාත්මක කර තිබුණි. | අයවැය ගත සංවර්ධන යෝජනා වර්ෂය තුළ ක්‍රියාත්මක කළ යුතුවේ. | 2020 වර්ෂයේ අයවැය ලේඛනයේ ඇතුළත් කර්මාන්ත වර්ෂය තුළම නිම කිරීමට කටයුතු කරමි. |

(ඇ) **තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටු කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන න්‍යාය 2030 පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස්කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනා ගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය වරින්වර පරීක්ෂා කළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා සැලසුම් සකස් කර ඇති බව දන්වමි. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු යතුරුපැදියක පසුගිය වසර 05 තුළ ආදායම් බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාර්ෂිකව ආදායම් බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අයිතිය පළාත් පාලන අමාත්‍යාංශය සතු බැවින් ආදායම් බලපත්‍රය ලබා ගත නොහැකි වූ බව දන්වමි. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

#### (අ) සේවක පුරප්පාඩු හා අතිරික්තතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 06 ක් පිරවීමට හා අතිරික්තතා 12 ක් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක අතිරික්තතා විධිමත් කර ගැනීමට හා පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු 02 ක් සම්පූර්ණ කරගත් බවත්, ඉතිරි පුරප්පාඩු සම්පූර්ණ කර දෙන මෙන් පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇත. |
| (ii) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන පරිදි සමස්ථ කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් හා මානව සම්පත් සැලැස්මක් සකස් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ සිට කාර්යය සාධන ගිවිසුම් අත්සන් කරන බව දන්වමි. |

#### (ආ) සේවක ණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | නිලධාරීන් තිදෙනෙකුට ඉකුත් වර්ෂයන්හිදී ලබා දී තිබුණු සහ වැඩියෙන් අයකර ගත් එකතුව රු. 50,365 ක සේවක ණය අයකර ගැනීමට/ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | සේවක ණය අයකර ගැනීමට / නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | සේවක ණය මුදලින් රු. 9,464 ක් අය කර නිරවුල් කර බවත්, ඉතිරි රු. 42,673 ක මුදල ඉදිරියේදී අයකර ගන්නා බව දන්වමි. |
| (ii) | ස්ථාන මාරු වී පැමිණි නිලධාරියකුගෙන් ණය වාරික 32 ක් සඳහා අය කළ රු. 66,323 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | සේවක ණය අයකර නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | දකුණු පළාත් ලේකම්ගේ 2017 අප්‍රේල් 28 දිනැති ලිපියෙන් ලද උපදෙස් මත ණය වාරික අයකර ගැනීම කලාප අධ්‍යාපන කාර්යාලය වෙත නොයැවූ බව දන්වමි. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව ඉකුත් සහ සමාලෝචිත වර්ෂය තෙක් අනුමත කළ ගොඩනැගිලි සැලසුම් 168 කින් 04 ක් සඳහා පමණක් අනුකූලතා සහතික නිකුත් කර තිබුණි. | අනුමත ගොඩනැගිලි සැලසුම් සඳහා අනුකූලතා සහතික ලබාගැනීමට උනන්දු කළ යුතුවේ. | ගොඩනැඟිලි ඉදිකිරීම් පරීක්ෂා කිරීමට තක්සේරු නිලධාරීන් දැනුවත් කළ බවත්, අනුකූලතා සහතික ලබා ගැනීමට හා කාලය දීර්ඝ කිරීම් ඉල්ලුම් කිරීමට දේපල හිමියන් දැනුවත් කරන බව දන්වමි. |
| (ආ) | දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපප 01/2010/පපාකො/හා 2010 දෙසැම්බර් දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සභාව සතු සූරියවැව බස්නැවතුම්පොළ කඩ කාමර 09 ක කඩ කුලී තක්සේරුව කාලීනව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කඩ කාමර නවයෙහි සන්තකය පවරා ගෙන තක්සේරුව සිදු කරන බව දන්වමි. |
| (ඇ) | ප්‍රාදේශීය සභා පනතේ 142(5) වගන්තිය ප්‍රකාරව තක්සේරු කුලිය අයකිරීමට ක්‍රියා නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී සභාවට අහිමි වූ ආදායම රු.46,750 ක් විය. | පනත අනුව තක්සේරු කුලී අයකිරීමට කටයුතු කළ යුතුවේ. | තක්සේරුව පරිදි කඩ කුලී අය කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | 1993 ජූනි 24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පලකර ඇති 1980 අංක 49 දරන ජාතික පාරිසරික පනතේ නියමයන් පරිදි ලබාගත යුතු පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තා නොමැති ව්‍යාපාර ස්ථාන 27 ක් සඳහා වෙළඳ බලපත්‍ර ලබා දී තිබුණි. තවද සමාලොචිත වර්ෂය සඳහා පාරිසරික බලපෑම තක්සේරු කිරීමේ වාර්තා ලබාගත් ව්‍යාපාර ස්ථාන 32 ක් වෙළඳ බලපත්‍ර ලබාගැනීමට උනන්දු කර වීමට සභාව කටයුතු කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | එම ව්‍යාපාර ස්ථාන අදාල බලපත්‍ර ලබා ගැනීමට උනන්දු කරන බව දන්වමි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ජල පාරිභෝගිකයින් 75 දෙනෙකුගෙන් අයවිය යුතු ජල ගාස්තු රු.75,110,705 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ජල ගාස්තු ලේඛනයේ ආරම්භක සහ අවසාන ශේෂයන් සටහන්කර නොතිබුණි. | හිඟ ජල ගාස්තු අයකර ගැනීමට හා අදාල ලේඛන නිවැරදිව නඩත්තු කිරීමට කටයුතු කළ යුතුවේ. | හිඟයෙන් රු. 12,720 ක් අයකර ගත් බවත්, ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අවසානයට සභාව භුක්ති විඳින ඉඩම් 06 ක් ලේඛනගත කර නොතිබුණි . | සභාව සතු වත්කම් ලේඛනගත කළ යුතුවේ. | මෙම ඉඩම් ප්‍රාදේශීය ලේකම්ට හා මහවැලි අධිකාරියට අයත් බවත්, පවරා දුන් පසු ගිණුම්ගත කරන බව දන්වමි. |

**3.5.2 පවරා නොගත් වත්කම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාව සතු රු.21,079,260 ක් වටිනා ඉඩම් 15 ක් හා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින ක්‍රීඩා භූමි 22 ක, සුසාන භූමි 32 ක, ප්‍රජාශාලා 81ක හා අනෙකුත් පොදු කටයුතු සඳහා වෙන් කර ඇති ඉඩම් 36 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් වල නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රතිපාදන සලසා ගෙන සියළු ඉඩම් මැනුම් කටයුතු සිදු කර පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරමි. |
| (ආ) | සභාව සතු වටිනාකම රු.1,125,000 ක් වූ වාහන 03 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් වල නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ට්‍රැක්ටරය සහ යතුරු පැදියෙහි ලියාපදිංචිය පිළිබඳ විස්තර නොතිබීම හා අත් ට්‍රැක්ටරය ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයට අයත් බවත්, ඉදිරියේදී පවරා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**3.5.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් පාලන දෙපාර්තමේන්තු යාන්ත්‍රික ඉංජිනේරුගේ අංක දපපා/ඉං/5/5/සුරි හා 2014 ජුනි 27 දිනැති ලිපිය මඟින් අපහරණය කිරීමට නිර්දේශ කළ සභාව සතු 2 කැබ් රථය016 දී ධාවනයෙන් ඉවත් කළත් එම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. | නිර්දේශ අනුව කටයුතු කළ යුතුවේ. | අපහරණය ඉදිරියේදී සිදු කරන බව දන්වමි. |